චක්‍රලේඛ අංක :52/2004

ද.ප.ස./තිසි/චක්‍ර,
සමුපකාර සේවක කොමිෂන් සභාව,(ද.ප.)
අංක 07, බාලදක්ෂ මාවත,
ගාල්ල. 2004.04.26

දකුණු පළාතේ සියලුම සමුපකාර සමිතිවල
සභාපතිවරුන් වෙත.

වැටුප් පරිමාණයක උපරිමයට පැමිණි සේවකයින්ට
වැටුප් වර්ධක ලබාදීම.

1998 අංක 01 දරණ දකුණු පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තියේ 11(1) වගන්තියේ (අ)හා (ඇ) උප වගන්ති යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර දකුණු පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් සමුපකාර සමිතිවල තනතුරු දරණ සේවකයින්ගෙන් වැටුප් පරිමාණයේ උපරිම වැටුප් පියවරට පැමිණි සේවකයින්ට උපරිමයේ රැඳී සිටීම වෙනුවෙන් වැටුප් වර්ධක ලබාදීමට තීරණය කර ඇත.

02. 2003.12.31 දින දක්වා හිඟ වැටුප් ගෙවීමකින් තොරව 2003.01.01 දින සිට උපරිම වැටුප් පියවරට එළඹි සේවකයින්ට සිය තනතුරට අදාල වැටුප් පරිමාණයේ අවසානයේ ඇති අගයට සමානව වැටුප් වර්ධක තවදුරටත් වාර්ෂිකව උපයා ගැනීමට ඉඩදිය හැකිය.

03. 2003.01.01 දින වන විට වසරක් හෝ ඊට වැඩි කාලයක් උපරිම වැටුප් පියවරේ සිටි හා වැටුප් වර්ධකයක් ලබා නොගත් සේවකයින්ට එක් වැටුප් වර්ධකයක් 2003.01.01 දින සිට ලබා දෙන අතර, ඉන් අනතුරුව මෙම සේවකයින්ගේ වැටුප් වර්ධක දිනය වන්නේ ජනවාරි 01 වන දාය. විනය නියෝගයක් මත වැටුප් වර්ධක අහිමි කර ඇති සේවකයින්ට මෙය අදාල නොවන අතර, විනය නියෝගය අනුව ක්‍රියා කළ යුතුය.

04. 2003.01.01 දින වන විට වසරකට වඩා අඩු කාලයක් උපරිම වැටුප් පියවරේ සිටින හා 2003.01.01 දිනට පසුව එම වසර තුල වැටුප් වර්ධක දිනය යෙදෙන සේවකයින්ට විනය නියෝගයක් මත වැටුප් වර්ධක අහිමි කර නොමැති නම්, 2003 වර්ෂය තුල යෙදෙන වැටුප් වර්ධක දිනයේදී එක් වැටුප් වර්ධකයක් ලබා දෙන අතර, එම සේවකයින්ගේ වැටුප් වර්ධක දිනය වෙනස් නොවේ.

05. 2003.01.01 දින හෝ ඊට පසුව දැනට පවතින වැටුප් පරිමාණයන්හි උපරිමයට පැමිණෙන සේවකයින්ට උපරිමයට පැමිණීමෙන් පසු සෑම වර්ෂයක් වෙනුවෙන් මෙම චක්‍රලේඛයේ 02 හා 03 ඡේදවල විධිවිධාන වලට යටත්ව වැටුප් වර්ධක ලබාදිය හැකිය.

06. මෙම චක්‍රලේඛයේ විධිවිධාන මත 2003.01.01 දින සිට අදාල වැටුප් පියවරයන්හි පිහිටුවිය හැකි නමුත්, 2003.12.31 දක්වා කාල පරිච්ඡේදය සඳහා හිඟ වැටුප් හිමි නොවේ.

07. මෙම කරුණ සම්බන්ධව කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති 2001.01.2[illegible] දිනැති අංක 40/2001 දරණ චක්‍රලේඛය මෙයින් අවලංගු කෙරේ.

08. උපරිම වැටුප් පියවරේ සිටින සේවකයින්ගේ විස්තර සමිතිවලින් ගෙන්වා ගැනීමේදී කොමිෂන් සභාවේ අනුමැතියකින් තොරව සමහර සේවකයින්ට අතිරේක වැටුප් වර්ධක ගෙවා ඇති බව අනාවරණය වී ඇත. එබැවින්, ඉදිරියේදී සමිතිවල සේවය කරනු ලබන කිසිදු සේවකයෙකුට කොමිෂන් සභාවේ අනුමැතියකින් තොරව අතිරේක වැටුප් වර්ධක නොගෙවිය යුතු බව අවධාරණය කරමි.

09. සේවක අර්ථසාධක අරමුදල් ලබාගෙන දැනට කොන්ත්‍රාත් පදනම යටතේ සේවයේ යොදවා ඇති සේවක/සේවිකාවන්ට මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන අදාල නොවේ.

10. මෙම චක්‍රලේඛය දකුණු පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්ගේ එකඟත්වය ඇතිව නිකුත් කරනු ලැබේ.

කොමිෂන් සභාවේ නියමය පරිදි

(සුමතිපාල වාහලවත්ත),
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
දකුණ පළාත.

පිටපත්:- 1. අං.ස.ලේ/-- ද.ප.
2. ස.සං.කො/රෙ (ද.ප.)
3. පළාත් කොමිෂන් සභා ලේකම්වරුන් වෙත.
4. අදාල ගොනුවට.